# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**6 ශ්‍රේණිය** | **ඉතිහාසය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

### I කොටස

- **පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01) ඉතිහාසය ඉගෙන ගැනීමේ දී ප්‍රයෝජනයට ගන්නා පැරණි පොත්පත් හා ජනකතා .............................. මූලාශ්‍රවලට අයත් වේ. (සාහිත්‍යය/ පුරාවිද්‍යාත්මක/ සෙල්ලිපි)

02) ගෞතමී පුත්‍ර සාතකර්ණී රජුගේ යුධ ජයග්‍රහණය සිහිකරමින් ආරම්භ කර ඇති වර්ෂ ක්‍රමය .......................... ලෙස හැඳින් වේ. (හිජ්රි වර්ෂ / ක්‍රිස්තු වර්ෂ / ශක වර්ෂ)

03) මිනිසෙක් වීමට නැඹුරුවක් ඇති කළ පැරණිම වානරයා .................................... වේ. (හෝමෝ නියැන්ඩතාලෙන්සිස් / හෝමෝ සාපියන් / ඔස්ට්‍රොලෝපිතිකස්)

04) කඩදසි මුද්‍රණ යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වා දෙන ලද්දේ ............................... විසිනි. (ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන් / ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන් / මායා ශිෂ්ටාචාර වැසියන්)

05) මෙසපොතේමියානු ශිෂ්ටාචාරවාසීන් පොළොවට අධිපති දෙවියන් ලෙස .................................... හඳුන්වනු ලැබීය. (ඒන්කිකි / ඒන්ලිලි / අනු)

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06) ලෝකයේ බිහිවූ ඉපැරණි ශිෂ්ටාචාර අතරින් යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්නයේ පිහිටියේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි. ( )

07) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජීවත් වූ ගිල්ග - මේෂ් නැමැත්තා විසින් කූන්‍ය අක්ෂර භාවිතයෙන් ලියන ලද වීර කාව්‍ය ලෝකයේ පැරණිම සාහිත්‍ය කෘතිය යි. ( )

08) දූව දඬු හා කොළ අතු භාවිතා කරමින් මිනිසා නිවාස සාදාගෙන එකම ස්ථානයක දිගු කාලයක් රැඳී සිටීම සිදුවූයේ මධ්‍යශිලා යුගයේ දී ය. ( )

09) මුල්වරට රබර් බෝලයක් නිපදවීමේ ගෞරවය හිමිවන්නේ ඊජිප්තු වැසියන්ට ය. ( )

10) තිරිඟු වගාව මුල්වරට ආරම්භ වූයේ මධ්‍යම මෙක්සිකෝවේ ය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11) මිනිසා විසින් පළමුවරට ගින්දර භාවිතා කිරීම පිළිබඳ සාක්ෂි ලැබෙන්නේ
1) තුර්කියෙනි 2) ඊශ්‍රායලයෙනි 3) චීනයෙනි 4) ඉන්දියාවෙනි

12) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණ ඇත්තේ

1) ක්‍රි.ව. 240 දී පමණ
2) ක්‍රි.පූ. 544 දී පමණ
3) ක්‍රි.ව. 544 දී පමණ
4) ක්‍රි.පූ. 240 දී පමණ

13) ✶මොහු ජීවත් වූයේ මීට අවුරුදු හය ලක්ෂයකට ඉහත දී ය.
✶සතුන්ගේ ඇටකටු භාවිත කර නිවාස ඉදි කළේ ය.
✶එළවලු වර්ග පිස ආහාරයට ගෙන තිබේ.
ඉහත තොරතුරු අදාළ වන්නේ කවර මානව වර්ගයාට ද?

1) හෝමෝ හැබිලිස් ය
2) ඔස්ට්‍රොලෝපිතිකස් ය
3) හෝමෝ ඉරෙක්ටස් ය
4) හෝමෝ නියැන්ඩතාලෙන්සිස් ය

14) නයිල් ගංගාව මුල්කරගෙන ඇරඹුණු ශිෂ්ටාචාරය කුමක්ද?

1) චීන ශිෂ්ටාචාරය
2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය
3) ඊජිප්තු ශිෂ්ටාචාරය
4) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

15) ක්‍රිස්තු වර්ෂ 2020 වර්ෂය බුද්ධ වර්ෂවලින් දැක් වූ විට ලැබෙන පිළිතුර වන්නේ

1) බු.ව. 2564
2) බු.ව. 2463
3) බු.ව. 2500
4) බු.ව. 2563


- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල A තීරුවට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලද උරුමයක් වේ. | A- මායා ශිෂ්ටාචාර වැසියන් |
| 17) මහාවංශය රචනා කරන ලදි. | B- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් |
| 18) පළමුවරට රබර් බෝලය නිපදවන ලදි. | C- නව ශිලා යුගයේ |
| 19) නිවාසවල භාවිතා කළ දියුණු ජල නළ පද්ධතියක් හමු වී ඇත්තේ | D- නගර සැලැස්ම |
| 20) සතුන් ශීලෑ කරමින් ගොවිතැන් කටයුතු ආරම්භ කළේ | E- මහානාම හිමි |

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) (අ)




i. පහත සිතියමේ A හා C අක්ෂරවලින් දැක්වෙන පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර දෙක නම් කරන්න. (ල 1)

ii. B අක්ෂරයෙන් දැක්වෙන ශිෂ්ටාචාරය පිහිටි ගංගා දෙක ලියා දක්වන්න. (ල 1)

iii. මොංගොලොයිඩ මානව වර්ගය ජීවත් වන චීනය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද? (ල 1)

iv. කොකසොයිඩ් මානව වර්ගය ජීවත් වන ඕස්ට්‍රේලියාව දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල 1)

(ආ) පහත සඳහන් දෑ අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයකට දැයි ලියන්න.

i. සෙල්ලම් මැටි කරත්තය ............................................................

ii. කුන්‍ය අක්ෂර ............................................................

iii. පිරමීඩ ............................................................

iv. නෙපට්ටි රැජිණ ............................................................

(ල 4)

(ඇ)



i. මෙම පින්තූරයෙන් නිරූපණය වන්නේ කුමක්ද? (ල 1)

ii. මෙය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයකට ද? (ල 1)

iii. ඔවුන් භාවිත කළ උපකරණ දෙකක් ලියා ඒවා තනා ඇති දෑ වෙන වෙනම ලියන්න. (ල 2)

(ඈ)



i. මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමන පුද්ගලයෙක් ද? (ල 1)

ii. ඔහු උසස් පුද්ගලයෙකු ලෙස දැක්වීමට යොදා ඇති සංකේතය කුමක්ද? (ල 1)

iii. මෙම මූර්තිය ඇස් අඩවන් ආකාරයට නෙලා තිබීමෙන් පෙන්නුම් කිරීමට උත්සාහ දරා ඇත්තේ කුමක්ද? (ල 2)

02)

i. ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධානම මූලාශ්‍රය කුමක්ද? (ල 2)

ii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලට උදාහරණ හතරක් ලියන්න. (ල 2)

iii. හෝමෝ සාපියන් සතු හැකියාවන් තුනක් ලියන්න. (ල 3)

iv. මිනිසාගේ දියුණුව සම්බන්ධයෙන් නව ශිලා යුගයේ දී සිදු වූ සිදුවීම් දෙකක් ලියන්න. (ල 4)

03)

i. පුරා ශිලා යුගයේ ජීවත් වූ මානවයන් අනුගමනය කළ ප්‍රධාන අවමංගල්‍ය කටයුත්තක් සඳහන් කරන්න. (ල 2)

ii. පහත A හා B වශයෙන් දැක්වෙන ධාන්‍ය වර්ග මුල්වරට වගා කළ ප්‍රදේශ පිළිවෙලින් ලියන්න.(ල 2)

a) බඩ ඉරිඟු

b) තිරිඟු

iii. මුහුණේ ස්වරූපය අනුව හෝමෝ සාපියන් මානවයා බෙදෙන ප්‍රධාන වර්ග තුනක් ලියන්න. (ල 3)

iv. පුරාශිලා යුගයෙන් මධ්‍යශිලා යුගයට පිවිසි මානවයාගේ ක්‍රියාකාරකම්වල ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න. (ල 4)

04)

i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට වර්තමානයේ අයත් වන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල 2)

ii. ලෝකයේ මුල් ශිෂ්ටාචාර පිළිබඳ පහත අසා ඇති තොරතුරු ලියා දක්වන්න. (ල 2)

a) ඊජිප්තු ශිෂ්ටාචාරයේ රජවරු හැඳින්වූ නම

b) මාලිමා යන්ත්‍රය ලෝකයට හඳුන්වා දුන් ශිෂ්ටාචාරය

iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති නගර තුනක් ලියන්න. (ල 3)

iv. මෙම ශිෂ්ටාචාරය දියුණුව පැවති බව පෙන්නුම් කරන ලක්ෂණ දෙකක් ලියන්න. (ල 4)

05)

i. මෙසපොතේමියානු සමාජය බෙදී ගිය කොටස් හතරක් නම් කරන්න. (ල 4)

ii. පහත දැක්වෙන වගුවේ ඇති තොරතුරුවලට අදාළ නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න. (ල 7)

| A | B |
|---|---|
| 1. මෙසපොතේමියාවේ උතුරු ප්‍රදේශයේ ජීවත් වූ අය | ……………………………..... |
| 2. රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කිරීම | ……………………………..... |
| 3. පැරණිම අක්ෂර පද්ධතිය | ……………………………..... |
| 4. ලෝකයේ පැරණිතම නීතිය | ……………………………..... |
| 5. රූප භාවිතයෙන් නිර්මාණය කළ අක්ෂර | ……………………………..... |
| 6. මළ සිරුරු කල්තබා ගැනීම | ……………………………..... |
| 7. බූරුවා පිට බඩු පටවාගෙන යාම | ……………………………..... |

(පිරිමීඩ / හමුරාබි නීතිය / තවලම / කූන්‍ය අක්ෂර / ඇසිරියන් / චිත්‍රාක්ෂර / සිගුරට් / මමීකරණය)

06)

i. පහත සඳහන් A හා B කරුණුවලට අදාළ පිළිතුරු ලියා දක්වන්න. (ල 2)

a) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබසින ලද ප්‍රදේශය

b) විජය කුමරුන් විසින් විවාහ කර ගන්නා ලද යක්ෂ ගෝත්‍රික කාන්තාව

ii. විජය කුමරු සමග පැමිණි ප්‍රධාන අමාත්‍යවරු දෙදෙනෙකු නම් කරන්න. (ල 2)

iii. විජය කුමරු මෙරටට පැමිණෙන අවධියේ මෙරට සිටි ජනතාව ක්‍රමවත් තාක්ෂණ දියුණුවක් ලබා සිටි ක්ෂේත්‍ර තුනක් ලියන්න. (ල 3)

iv. පණ්ඩුකාභය රජතුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල 4)

07)

i. අතීතයේ ශ්‍රී ලංකාව හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. (ල 2)

ii. ලංකාවේ වාසය කළ යක්ෂ ගෝත්‍රික කණ්ඩායමට අයත් ව තිබූ නගර දෙකක් ලියන්න. (ල 2)

iii. පණ්ඩුකාභය රජුගේ අනුරාධපුර නගර සැලැස්මේ පැවති ප්‍රධාන අංග තුනක් නම් කරන්න. (ල 3)

iv. පණ්ඩුකාභය රජු ඉටු කළ සේවාවන් දෙකක් ලියන්න. (ල 4)